# කර්මාන්ත අමාත්‍යාංශය

# ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්

## තනතුරු පුරප්පාඩු - පුල්මුඩේ යන්ත්‍රාගාරය/ප්‍රධාන කාර්යාලය

**පූර්ණ රජය සතු සමාගමක් වන ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනයෙහි පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01. ජ්‍යෙෂ්ඨ මූල්‍ය කළමනාකාර (Senior Finance Manager)

**ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණිය** (HM-1-1)

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)**

**බාහිර අයදුම්කරුවන්**

**පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.**

1) **අධ්‍යාපන සුදුසුකම් / වෘත්තීය සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මූල්‍ය/ වානිජවේදී/ගිණුම් ක්ෂේත්‍රය පිළිබඳව උපාධියක් ලබා තිබීම.

**සමග**

මූල්‍ය හා ගිණුම් ක්ෂේත්‍රය පිළිබඳව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය/වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය/ වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනය ආශ්‍රිත සාමාජිකත්වය (ICA/CIMA/ACCA) ලබා තිබීම.

**සහ**

පළපුරුද්ද - රජයේ , රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් සමඟ ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

2) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය /වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය/ වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ පූර්ණ සාමාජිකත්වය (ICA/CIMA/ACCA) ලබා තිබීම.

**සහ**

පළපුරුද්ද -රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් සමඟ ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.**

1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2) කළමනාකාර (MM 1-1) සේවා ශ්‍රේණියෙහි I වන ශ්‍රේණියෙහි අවම වශයෙන් වසර පහ (5) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

HM -1-1, **සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

**වැටුප් කේත අංකය** - HM -1-1, රු.80,295/- 2,270X15 = 114,345/-

රු.80,295/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

**වයස් සීමාව :** අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

HM -1-1 **වැටුප් කාණ්ඩය සඳහා පහත සඳහන් අමතර දීමනාවන් ද හිමිවේ.**

01. PED/1/2015, PED/1/2015(i) හා PED/1/2015(ii) යන චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රවාහන දීමනාව හෝ රාජකාරී කටයුතු සඳහා ආයතනයේ වාහනයක් යන දෙකෙන් එකක් ලබාදීම.

### 02. රසඥ (Chemist)

**කළමණාකාර සේවා ශ්‍රේණිය** (MM-1-1)

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව පිළිබඳව ලබාගත් උපාධියක්

**සහ**

රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල/ හෝ පිළිගත් ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ වසරක (01) පළපුරුද්ද

MM-1-1, සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

වැටුප් කේත අංකය - MM-1-1, රු.53,175/-=1,375X10, 1,910x15 = 95,575/-

රු.53,175/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

**වයස් සීමාව :** අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

### 03. අභ්‍යන්තර විගණන නිලධාරී (Internal Audit Officer)

**කනිෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණිය** (JM-1-2)

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)**

**බාහිර අයදුම්කරුවන්**

**පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.**

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, මූල්‍ය/ ගිණුම්/වාණිජවේදී පිළිබඳව ලබාගත් උපාධිය
2) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍ය පරීක්ෂණය (Intermediate level of Institute of Charted Accountants of Sri Lanka -ICASL)
3) වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (Charted Institute of Management Accounts - CIMA) අන්තර් මධ්‍ය පරීක්ෂණය
4) වරලත් පිරිවැය ගණකාධිකාරී ආයතනයේ (Association of Certificate and Corporate Accounts - ACCA) II වන අදියර
5) රාජ්‍ය කාර්මික විද්‍යාලය මගින් ලබා දෙනු ලබන උසස් ජාතික ගණකාධිකාරී ඩිප්ලෝමා / උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාව (HNDA/HNDC)

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.**

අ). ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

ආ). කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA-1-1) සේවා ශ්‍රේණියේ II වන ශ්‍රේණියේ අදාළ විෂය ක්ෂේත්‍රයෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

JM-1-2, **සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

වැටුප් කේත අංකය - JM-1-2, රු.43,355/-=755X10, 1,135x18 = 71,335/-

රු.43,355/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

**වයස් සීමාව :** අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

### 04. පරිපාලන නිලධාරී (Administrative Officer)

**කනිෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණිය** (JM-1-2)

**පුරප්පාඩු පවතින ස්ථානය - ප්‍රධාන කාර්යාලය (පුරප්පාඩු තනතුරු - 01)**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම් -**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, මානව සම්පත් කළමනාකරණය පිළිබඳව ලබාගත් උපාධියක්

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.**

1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2) කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA-1-1) සේවා ශ්‍රේණියේ II වන ශ්‍රේණියේ අදාළ විෂය ක්ෂේත්‍රයෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

JM-1-2, සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

වැටුප් කේත අංකය - JM-1-2, රු.43,355/-=755X10, 1,135x18 = 71,335/-

රු.43,355/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

**වයස් සීමාව :** අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

### 05. භාෂා පරිවර්තක (Translator)

**ක්‍රියාත්මක කිරීමේ /උපදේශන සේවා, සේවා ශ්‍රේණිය** (MA-4)

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, භාෂාවන් පිළිබඳව ලබාගත් උපාධියක් (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ඇතුලුව)

**සටහන :** සිංහල මාධ්‍යයෙන් උපාධිය ලබා ඇත්නම් අන් භාෂාවන් ලෙස දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් ඇතුළත් විය යුතුය. එමෙන්ම දෙමළ බසින් උපාධිය ලබා ඇත්නම් අන් භාෂාවක් ලෙස සිංහල හා ඉංග්‍රීසි භාෂාවන් ඇතුළත් විය යුතුය. (උපාධිය සඳහා අනෙකුත් භාෂා විෂයයන් සමත් වී නොමැති නම් උපාධිය හදාරන ලද මාධ්‍යයට අමතරව විෂයයන් ලෙස අනෙකුත් භාෂාවන් 02 සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සම්මාන ලබා තිබිය යුතු වේ.)

**MA-4, සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය**

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

වැටුප් කේත අංකය - MA-4, රු.37,970/-=755X10, 930x15, 1,135x5 = 65,145/-

රු.37,970/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

**වයස් සීමාව :** අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

### 06. රසායනාගාර සහකාර (Lab Assistant)

කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා ශ්‍රේණිය (MA-2-1)

පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)

**තාක්ෂණික නිපුණතා /ප්‍රවීනතා**

රසායනාගාර සහකාර තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) මට්ටමට අඩු නොවන්නාවූ පාඨමාලාවක් සාර්ථකව හදරා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

MA-2-1, සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

වැටුප් කේත අංකය - MA-2-1, රු.30,310/-=300X10, 350x7, 495x4,660x20 = 50,940/-

රු.30,310/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

**වයස් සීමාව :** අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

### 07. කළමනාකරණ සහකාර (Management Assistant)

**කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ශ්‍රේණිය** (MA-1-1)

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 03)**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන**

අ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

i. සිංහල / දෙමළ

ii. ගණිතය ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළත්ව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

**හා**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**සමග**

තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම් - පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(i) ප්‍රාථමික ශ්‍රේණීය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ශ්‍රේණියන්හී පහත "අ", "ආ" සහ "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

අතුලුව විෂයයන් හතරකට සම්මාන සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළත්ව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

**හා**

පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදරා තිබීම.

(ආ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක් යටත් පිරිසෙන් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

MA-1-1, සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

වැටුප් කේත අංකය - MA-1-1, රු.27,910/-=300X10, 350x7, 495x4,660x20 = 48,540/-

රු.27,910/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

**වයස් සීමාව :** අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

### 08. පෙදරේරු (Mason)

**ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණිය** (PL-3)

**පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය (පුරප්පාඩු තනතුරු - 01)**

**බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

**අධ්‍යාපන -** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

**සමග**

**ශිල්පීය නිපුණතා/ප්‍රවීනතා**

පෙදරේරු තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හී සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.**

1. පෙදරේරු ක්ෂේත්‍රයේ වසර පහක (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් පෙදරේරු තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) සිව්වැනි (04) මට්ටමට නොඅඩු වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත්වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL-2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL-1) සේවා ශ්‍රේණියක සේවකයන් **හෝ**
2. පෙදරේරු තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හී සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

PL-3, සේවා ශ්‍රේණියට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2016 අනුව

**වැටුප් කේත අංකය** - PL-3, රු.26,290/-=270X10, 300x10, 330x10, 350x12 = 39,490/-

රු.26,290/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

**වයස් සීමාව :** අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

**දීමනා හා ප්‍රතිලාභ**

**දීමනා**

01. භාණ්ඩාගාරය අනුමත කළ රු.17,800/- වන ජීවන වියදම් දීමනාව
02. මාසික ආහාර දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මාසික පැමිණීමේ දිරිදීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
04. මසකට රු.4,000/- වන දුෂ්කර දීමනාව (පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවකයන් සඳහා පමණී)
05. මාසික නිෂ්පාදනය මත ගෙවනු ලබන නිෂ්පාදන දිරි දීමනාව
06. රු.5,000/- වන මාසික අන්තර්දීමනාව
07. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව සන්නිවේදන බිල්පත් ගෙවීම. (HM-1-1, MM-1-1, JM-1-2 තනතුරු සඳහා පමණී)
08. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2017 ප්‍රකාර තනතුරට අදාළ සක්‍රිය සේවා කාලය පදනම් කරගෙන වෘත්තීය දීමනාව ගෙවීම් කරනු ලැබේ. (HM-1-1, MM-1-1 ශ්‍රේණියේ තනතුරු සඳහා පමණී)

**ප්‍රතිලාභ**

01. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)
02. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය
    i. වසරක් සඳහා රු. 200,000/- ක රෝහල් ගතවීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    ii. වසරක් සඳහා රු. 20,000/- ක බාහිර ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
    iii. වසරක් සඳහා රු. 5,000/- ක දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
03. ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබාදීම.
    i. අභ්‍යන්තර වෛද්‍යාධාර ක්‍රමය යටතේ වසර දෙකකට වරක් රු.12,000/- ක දීමනාව.
    ii. අභ්‍යන්තර වෛද්‍යාධාර ක්‍රමය යටතේ වසරකට වරක් බාහිර ප්‍රතිකාර වෙනුවෙන් රු. 5,000/- මුදලක් ලබා දීම
    iii. දරු උපතක් වෙනුවෙන් වසර 02 කට වරක් රු.12,000/- මුදලක් ලබා දීම.
05. මීට අමතරව ස්ථිර සේවකයන් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.
06. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 10% ක්ද, සමාගම විසින් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා ආයතනයේ දායකත්වය 3% වේ.

**පොදු කොන්දේසි**

1. සෑම ඉල්ලුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විම.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.
3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
4. තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ මුළු ඉපයීම් වලින් උපයන විට ගෙවීම් බද්ද (Pay as You Earn Pay Tax) අය කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර තම අදාළ දෙපාර්තමේන්තුවල/ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද තනතුරු සඳහා අයදුම්පත් යොමු කිරීමේදී ඊමේල් ලිපිනයද ඇතුළත් කර ඔබගේ අත්සන සහිතව අයදුම්පත එවිය යුතු අතර, සියලුම සහතික පත්‍රවල ඡායාස්ථ පිටපත් ඒ සමඟ එවිය යුතුවේ. (නිසි පරිදි සහතික පත්‍රවල ඡායාපිටපත් යොමු කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

ඔබ විසින් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර රාජගිරිය, සරණ මාවතේ, අංක 341/13 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති වෙත 2024 අප්‍රේල් මස 22 දිනට පෙර ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් අයදුම්පත් යොමු කළයුතු වේ.

**සභාපති**
**ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්**
**අංක 341/13, සරණ මාවත, රාජගිරිය.**